## පෝරතීවුපත්තු ප්‍රාදේශීය සභාව

-----------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශ

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම

---------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2014 මාර්තු 27 දින ද, ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2013 අප්‍රේල් 10 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 04 දින සභාවේ, සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි.

1.2 මතය

--------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශ වලින් 2013 දෙසැම්බර් 31 දිනට පෝරතීවු පත්තු සභාවේ මූල්‍ය තත්ත්වය එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල වීම

-------------------------------------------------------

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශ ලේකම්ගේ 2014 ජනවාරි 27 දිනැති පීඑල්/05/පීඒ/එස්එෆ්පීඑස්ඒඑස් දරන චක්‍රලේඛය අනුව රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ගෙවියයුතු රු. 16,000 ක විගණන ගාස්තු සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) 2011 වර්ෂයෙදි සිදුවූ ගංවතුර හේතුවෙන් මන්ඩූර් මහජන පුස්තකාලයේ තිබූ පොත් 141 ක් සම්පූර්ණයෙන් විනාශයට පත්වී තිබුණ නමුත් ඒවා පොත්වලින් ලියාහැරීමට

කටයුතු නොකිරීම නිසා මූල්‍ය ප්‍රකාශයන් හි  වත්කම් වල අගය වැඩියෙන් දන්වා තිබුණි.

(ඈ) 1990 වර්ෂයේදීවූ යුධමය වාතාවරණ හේතුවෙන් රු. 2,525,601 ක් වටිනා ලී බඩු විනාශයට පත්වී තිබුණද, එවා ලියාහැරීමට කටයුතු නොකිරීම නිසා ගිණුම් ප්‍රකාශයන්හි වත්කම්වල අගය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) 2013 දෙසැම්බර් 31 දිනට සේවක ණය ශේෂය ලේජරය අනුව රු. 2,391,852 ක් ලෙස පෙන්වා ගිණුම් ප්‍රකාශ වල රු. 2,489,157 ක් වශයෙන්, පෙන්වා තිබූ හෙයින් එදිනට ණය ශේෂය රු. 97,305 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයෙන් 2008 වර්ෂයේ ලැබී තිබූ රු. 1,319,050 ක් වටිනා කැබ් රථය ගිණුම්වලට ගෙනවිත් නොතිබුණි.

1.3.3 ලැබියයුතු සහ ගෙවියයුතු ගිණුම්

------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 වර්ෂය අවසානයට වර්ෂ 02 සිට 10 දක්වා හිගවතිබූ රු. 37,950 ක බදු ආදායම අයකර ගැනීමට හෝ ඒ සඳහා අවශ්‍ය පියවර ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ආ) 1991 – 2010 කාලපරිච්ඡේදය තුල නොයෙකුත් අවශ්‍යතාවයන් සඳහා සේවකයින් 12 දෙනෙකුට ලබාදී තිබූ රු. 70,304 ක අත්තිකාරම් මුදල් අයකර ගැනීමට හෝ පොත්වලින් ලියාගැරීමට කටයුතු නොකර දිගටම ගිණුම් ප්‍රකාශ වල පෙන්වා තිබුණි.

(ඇ) ගෙවියයුතු අත්තිකාරම් මුදල වන රු. 34,666 ක මුදල ගෙවා නිම නොකර 2009 වර්ෂයේ සිට දිගටම ගිණුම්වල දක්වා තිබුණි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

------------------------------------

මූල්‍ය ප්‍රකාශ වල දක්වා තිබූ පහත දැක්වෙන විෂයයන් ඉදිරියේ පෙන්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විෂයය | වටිනාකම<br>රු | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| ඉඩම් සහ ගොඩනැගිලි | 152,550,242 | හිමිකම් ඔප්පු |
| යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 1,691,880 | ස්ථාවර වත්කම් ලේඛන, සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| ලී බඩු හා සවිකිරීම | 912,499 | |
| මෝටර් වාහන | 3,539,960 | |
| පුස්තකාල පොත් | 1,634,005 | |

1.3.5 නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

-----------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති යනාදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති-1988 | |
| (i) 1පරිච්ඡේදයේ 5 (XII) වගන්තිය | මුදල්, ගබඩා ද්‍රව්‍ය සහ චෙක්පත්වලට අත්සන් තැබීම යනාදී කටයුතු නිලධාරින් හතර දෙනෙකුට ක්‍රමානුකූලව භාරදී තිබුණද ඔවුන්ගෙන් ආරක්ෂක ඇප ලබා ගෙන නොතිබුණි. |
| (ii) III පරිච්ඡේදයේ 81 වගන්තිය | ඉඩම් වල අයිතිය පැවරීම සම්බන්ධව මුද්දර බදු ප්‍රතිපූර්ණ කිරීමේ අයදුම්පත් රෙජිස්ටාර් ජනරාල් වෙතද අනෙකුත් ගනුදෙනු සම්බන්ධ බදු ප්‍රතිපූර්ණය කිරීම සඳහාවූ අයදුම්පත් මහාභාණ්ඩාගාරයේ අධ්‍යක්ෂකවරයාටද දඩමුදල් ප්‍රතිපූර්ණ කිරීම සඳහාවූ අයදුම්පත් උසාවිවල ලේඛකාධිකාරි වෙතද එක් එක් කාර්තු අවසානයේදී ඉදිරිපත් කර නොතිබුණි. |
| (iii) X වැනි පරිච්ඡේදයේ 191 වගන්තිය | සමාලෝචිත වර්ෂයේ මහා සභා රැස්වීම් දොලහක් පවත්වා තිබූ නමුදු, එම රැස්වීම් වාර්තාවල සහතික කළ පිටපත් විගණනයට ඉදිරිපත්කර නොතිබුණි. |
| (ආ) නැගෙනහිර පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ අංක PT/09/2010 | ප්‍රාදේශීය මිලදී ගැනීම් කමිටු සහ පළාත් මිලදී ගැනීම් කමිටු වලට බාහිර කාර්යාලයකින් එක් අයෙකු තුන්වැනි සාමාජිකයකු ලෙස ඇතුලත්වියයුතු බව සඳහන් වී ඇතත් එසේ ඇතුලත් නොකර සමාලෝචිත වර්ෂයේ ටෙන්ඩර් කමිටු තීරණ ලබාගෙන තිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු.3,274,374 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු.1,940,011ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.5,214,385 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

2.2 ආදායම් කළමනාකරණය

----------------------------

2.2.1 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

---------------------------------------

සභාව විසින් ඉදිරිපත් කර තිබූ සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් අතර සැළකිය යුතු විචලනයන් නිරීක්ෂණය විය.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| බදු | 438,400 | 697,500 | 259,100 |
| බලපත්‍ර ගාස්තු | 920,000 | 1,689,571 | 769,571 |
| වෙනත් ආදායම් | 3,965,000 | 2,912,224 | (1,052,776) |
| රාජ්‍ය බදු ආදායම් | 10,913,990 | 11,737,483 | (823,493) |

2.2.2 වරිපනම් හා බදු

-----------------

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 134 වගන්තිය අනුව ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ තිබෙන ඉඩම් සහ ඉදිකරන ලද නිවාස, ගොඩනැගිලි සඳහා වරිපනම් බදු අයකර ගැනීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් වාර්ෂික වටිනාකම තක්සේරු කරවා ගැනීම සඳහා කටයුතු නොකිරීම නිසා දල වශයෙන් රු. 800,000 වාර්ෂික ආදායමක් අහිමිවී තිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතාවය

----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1990 – 2002 කාලපරිච්ඡේදය තුල ස්ථාන මාරුවී ගිය / විශ්‍රාම ගිය සේවකයින් හත් දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂය වන රු. 486,097 ක මුදල විශ්‍රාම පාරිතෝෂිකයෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු නොකර අයවියයුතු මුදලක් ලෙස පොත්වල දිගටම පෙන්නුම්කර තිබුණි.

(ආ) පළාත් නිශ්චිත සංවර්ධන ආධාර යටතේ විවේහානන්දපුරම් සහ නෙල්ලිකාඩු යන ස්ථානවල ලිං දෙකක් සහ ඒ හා සම්බන්ධ ප්‍රවේශ මාර්ග දෙකක් ඉදිකිරීම සඳහා රු. 633,930 ක මුදලට කොන්ත්‍රාත් ප්‍රදානය කර වැඩ නිමකර තිබුණි. නමුත් 2014 මැයි 05 දින පවත්වන ලද පරික්ෂණයේදී උක්ත ප්‍රවේශ මාර්ග දෙක ඉදිකර නොතිබූ අතර ඒ සඳහා කොන්ත්‍රාත්කරුවෙත මුදල් ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය. ඒ අනුව ඉදිනොකරන ලද වැඩ කොටස සඳහා කොන්ත්‍රාත්කරු වෙත රු. 136,000 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

4 ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

-----------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය

----------------------

එක් එක් පළාත් පාලන ආයතන තමන්ගේ හැකියාව අනුව අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා ගතයුතු බව පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ 2005 නොවැම්බර් 08 දිනැති අංක 03 දරන පළාත්පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛයේ 8 වන වගන්තිය පරිදි සභාවේ අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා නොතිබුණි.

4.2 අයවැය පාලනය

------------------

අයවැයගත වියදම් සහ තථ්‍ය වියදම් අතර 11 % සිට 40 % දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛණය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණ බව නිරීක්ෂණය විය.

5 පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම් කරණය

(ආ) ස්ථාවර වත්කම් පාලනය

(ඇ) අයවැය පාලනය

(ඈ) ආදායම් රැස්කිරීම